# FOOD CONTROL ADMINISTRATION UNIT

Ministry of Healthcare & Nutrition
"Public Health Complex"
555/5, Elvitigala Mawatha – Colombo-05 -Sri Lanka
Tel / Fax- +94 11 2368727
E-mail: fdienfor@yahoo.com


PA/EOH/FCAU/5/2010
2010.08.10

විධාන අංකය : FCAU/05/2010

සියලුම
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
මහ නගර සභා නාගරික කොමසාරිස් වරුන්
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (කො.න.ස/ම.න.ස)

## පලතුරු කල් තබා ගැනීම සඳහා ෆෝමලින් සහ පලතුරු ඉදවීම සඳහා කාබයිඩ් වැනි ද්‍රව්‍ය භාවිතා කිරීම

1980 අංක 26 දරණ ආහාර පනතේ 11 වන වගන්තිය සමඟ කියවිය යුතු 1991 අංක 20 දරණ ආහාර (සංශෝධන) පනතේ 8 (2) වගන්තිය ප්‍රකාරව මෙම විධානය නිකුත් කරනු ලැබේ.

01. දිවයින පුරා සිටින පලතුරු වෙළඳුන්, පලතුරු ආනයනය කරන වෙළඳුන්, පලතුරු බෙදාහරින්නන් හා විකිණීම සඳහා පලතුරු ගබඩා කරන පුද්ගලයින් විසින් ෆෝමලින් යොදා පලතුරු කල් තබා ගැනීම හා කාබයිඩ් යොදා පලතුරු ඉදවීම කරනු ලබන බවට මහජන පැමිනිලි ලැබී තිබේ.

02. 2010.07.22 දින පැවති පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීමේදී ද දීර්ඝ ලෙස මෙම කරුන සාකච්ඡා වී ඇත. තවද මෙම තත්වය වැලක්වීම සඳහා සෞඛ්‍ය බලධාරීන් මෙන්ම ආහාර පනත යටතේ බලය ලත් නිලධාරීන් ද ඒ තරම් කාර්යයක් ඉටු නොකරන බවද එම කමිටුවේ දී අවධාරණය කර ඇත.

03. පලතුරු ඉදවීම සඳහා කාබයිඩ් භාවිතා කිරීම හෝ පලතුරු කල් තබා ගැනීම සඳහා ෆෝමලින් භාවිතා කිරීම 1980 අංක 26 දරණ ආහාර පනත හා එහි නියෝග උල්ලංඝනය කිරීමක් බව අවධාරණය කරමි.

> *කාබයිඩ් භාවිතා කිරීම පිලිබඳව වූ නියෝගයන් සඳහන් 1993.10.14 දින ප්‍රකාශයට පත් කර ඇති අංක 788/7 දරන ආහාර (ලේබල් කිරීම හා විවිධ) නියෝග 1993 ගැසට් පත්‍රයෙන් උපුටා ගත් අදාල වගන්ති ඇතුලත් පිටපතක් මේ සමග අමුනා ඇත.*
>
> *ආහාරයක් මනුෂ්‍ය පරිභෝජනය සඳහා සකස් කරන ස්ථානවල ආහාර වලට මිශ්‍ර කිරීම සඳහා යොදා ගැනීමට අදහස් කරනු ලබන භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් පිලිබඳ නෛතික තත්වය ආහාර පනතේ 26 (1) (ආ), (ඇ) වගන්ති සඳහන් පූර්ව නිගමන යටතේ පැහැදිලි කර ඇත. (අදාල පිටපතක් මෙ සමග අමුනා ඇත.)*

04. ඉහත දැක්වෙන නිති ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් ඔබ බල ප්‍රදේශවල පලතුරු වර්ග ඉදවීම සඳහා කාබයිඩ් භාවිතා කිරීම හෝ පලතුරු වර්ග කල් තබා ගැනීම සඳහා ෆෝමලින් භාවිතා කිරීම කරනු ලබන සියලුම සැක සහිත ස්ථාන පරීක්ෂා කිරීමටත්, එවැනි ස්ථානවලින් පලතුරු සාම්පල් ගෙන අදාල

අ. පි. බ

අනුමත විශ්ලේෂකයෙකුට යවා විශ්ලේෂණය කරවමටත්, පලතුරු වර්ග ඉදවීම හෝ කල් තබා ගැනීම සඳහා භාවිතා කරන යම් රසායනික භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් ඇත්නම් එවා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමටත්, කටයුතු කරන ලෙස සියලුම නිලධාරීන්ට උපදෙස් දෙන්න.

05. මෙය ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කරන ලෙසත්, ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳව පහත දැක්වෙන ආකාරයට සකස් කරන ලද වාර්තාවක් අධ්‍යක්ෂ, පාරිසරික හා වෘත්තිය සෞඛ්‍ය, සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය, "සුවසිරිපාය" බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට එවීමට සලස්වන ලෙසත්, බලයලත් නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශය- ..............................................................

| අනු අංකය | ම.සෞ.ප කොට්ඨාශය | සොයා ගත් ද්‍රව්‍යන් | අත් අඩංගුවට ගත් ප්‍රමාණය | ලබා ගත් සාම්පල් සංඛ්‍යාව | ගත් ක්‍රියා මාර්ගය | වෙනත් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

..............................................................

සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීගේ අත්සන

දිනය

වෛද්‍ය යූ. ඒ මෙන්ඩිස්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
(ප්‍රධාන ආහාර බලධරයා)

අ. පි. බ

**අදාල කර ගත හැකි නීතිමය ප්‍රතිපාදනයන්**

1. කාබයිඩ් භාවිතා කිරීමෙන් පලතුරු වර්ග කල් තබා ගැනීම

1993.10.14 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 788/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1993 ආහාර (ලේබල් කිරීමේ සහ විවිධ) නියෝගවල 11 වන කොටසේ පොදු තහනම් කිරීම හා විකිණීම වර්ධමත් කිරීම යටතේ වන 26 වගන්තිය ප්‍රකාරව -

> " කිසිම තැනැත්තෙකු විසින් කාබයිඩ් ගෑස් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන ඇසිටලින් ගෑස් යොදා ගනිමින් කෘත්‍රිම ලෙස ඉදවනු ලැබූ යම් පලතුරු වර්ගයක් විකිණීම, විකිණීමට භාවිතා කිරීම, තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම විකිණීමේ කාරයය සඳහා හෝ විකිණීමට අදහස් කරනු ලබන යම් ආහාරයක් පිලියෙල කිරීමෙදි භාවිතයට ගැනීම තම සන්තකයේ තබා ගැනීම නොකල යුතුය"

2. 1980 අංක 26 දරණ ආහාර පනතේ 3 වන කොටසේ 26 (1) (ආ) සහ (ඇ) යන පූර්ව නිගමන යටතේ වන ප්‍රතිපාදන

> (ආ) යම් ආහාරයක් නිෂ්පාදනය කිරීම, පරීරක්ෂණය කිරීම, ඇහිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, හෝ විකිනීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්ථානයක තිබී සොයාගනු ලබන සාමාන්‍යයෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා භාවිතා කරනු ලබන, යම් ආහාරයක් මනුෂ්‍ය පරිභෝජනය සඳහා විකිනීමට ඇති ආහාර සකස් කිරීම හෝ එ ආහාර වලට මිශ්‍ර කිරීම සඳහා යොදාගැනීමට අදහස් කර තිබූ භාණ්ඩයක් ලෙස පූර්ව නිගමනය කිරීම.
>
> (ඇ) ආහාර සකස් කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්ථානයක තිබී සොයාගනු ලබන්නා වූ ද, ආහාර සංයුතියේදි හෝ ආහාර සකස් කිරීමේදි යොදා ගත හැකි වූ ද යම් ද්‍රව්‍යයක්, මනුෂ්‍ය පරිභෝජනය සඳහා වූ ආහාර සංයුතියේදි හෝ ආහාර සකස් කිරීමේදි යොදා ගැනීමට අදහස් කර තිබූ භාණ්ඩයක් ලෙස පූර්ව නිගමනය කිරීම.